www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත් සෝවියට් ගුරුකුලය

# ජෙෆ්රි ස්වේන් හා ඉයන් ඩී. තැචර් විසින් රචිත ට්‍රොට්ස්කි ජීවන චරිත ද්වය පිළිබඳ ව විවරනයක්

## තෙවන කොටස: ඉයන් තැචර්ගේ විධික්‍රමය

**Leon Trotsky and the post-Soviet school of historical falsificationA review of two Trotsky biographies by Geoffrey Swain and Ian Thatcher - Part 3**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2007 මැයි 11**

*මෙහි පලවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සභාපති වූ ද සමාජවාදී සමානතා පක්ෂයේ (ඇමරිකා එක්සත් ජනපද) ජාතික ලේකම් වූ ද ඩේවිඩ් නෝර්ත් විසින් මහාචාර්ය ජෙෆ්රි ස්වේන් සහ මහාචාර්ය ඉයන් ඩී. තැචර් යන ශාස්ත්‍රාලිකයින් දෙදෙනා ලියූ ලියොන් ට්‍රොට්ස්කිගේ චරිතාපදාන දෙකක් ගැන කරන ලද කොටස් හතරකින් යුත් විවරනයක තෙවන කොටසයි.*

ට්‍රොට්ස්කි, ජෙෆ්රි ස්වේන් විසිනි. පිටු 248, ලෝන්ග්මන්, 2006.
ට්‍රොට්ස්කි, ඉයන් ඩී. තැචර් විසිනි. පිටු 288, රූට්ලෙජ්, 2003.

ඉයන් තැචර්ගේ විධික්‍රමය ගැන මම දැනට ම කෙටියෙන් සඳහන් කර ඇත්තෙමි. තැචර්ගේ ට්‍රොට්ස්කි චරිතාපදානයේ හැඳින්වීමේ දක්නට ලැබෙන ඡේද තුනක් සමාලෝචනය කරමින් අපි මෙම විෂයයට යලි එලඹෙමු.

> "1917 පිලිබඳ ව ට්‍රොට්ස්කි කරන විස්තරයෙන් ගෞරව සහගත ව ඉස්මතු වන්නේ ඔහු ම පමනි. 1924 දී යමෙක් 'ඔක්තෝබරයේ පාඩම්'වල තර්කයන් පිලිගත්තේ නම්, ඒ වනවිට මිය ගොස් සිටි ලෙනින්ගේ තැන ගත හැකිව තිබුනේ එකම එක මිනිසෙකුට පමනි, එනම් ලියොන් ට්‍රොට්ස්කිය. 1917 දී මෙන්ෂෙවික්වාදයේ පාපයෙන් චූදිත වූ ට්‍රොට්ස්කිගේ සගයන් ඔහුගේ 'ඔක්තෝබරයේ පාඩම්' (නමැති කෘතිය) බන්ධනය කිරීම සඳහා යත්න දැරීම සාකල්‍යයෙන්ම තේරුම් ගත හැකි කරුනකි. ඔවුහු දේශන හා ලිපි මාලාවක් මගින් එය කලහ, ඉක්බිති එම ලිපි ඒකරාශී කොට පොතක් ලෙස රුසියානු බසින් ද පලකරන ලදී.
>
> "ප්‍රමුඛ බොල්ෂෙවිකයෝ (කමනෙව්, ස්ටැලින්, සිනොවියෙව් සහ බුඛාරින්) ද කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ (කොමින්ටර්න්) හා කොමියුනිස්ට් තරුන සංගමයේ (කොම්සොමොල්) නියෝජිතයෝ ද ට්‍රොට්ස්කිගේ ලියවිල්ල ඔක්තෝබර් විප්ලවයේ සැබෑ ඉතිහාසයක් නොවී යයි තර්ක කලහ. කෙනෙක් එකල ලියවුනු ලේඛනයන් ද එන්න එන්නම වැඩියෙන් සැපයෙන මතක සටහන් සාහිත්‍යය ද සලකා බැලුවහොත්, උදාහරනයක් හැටියට, ට්‍රොට්ස්කිගේ විරුද්ධවාදීන් කියා පෑවේ, ඔහුගේ මතකය විකෘති චිත්‍රයක් පින්තාරු කර තිබෙන බව ය. මෙයින් වඩාත් සැලකිල්ලට ගත යුතු කරුන නම්, ලෙනින් හා බොල්ෂෙවික් පක්ෂය විසින් ඉටු කරන ලද භූමිකාවන් අවම කල ට්‍රොට්ස්කි තමාගේ ම ප්‍රතිපදානය අතිශයෝක්තියට පත් කර ගත් බව ය. උදාහරනයක් හැටියට, ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය උඩ පක්ෂය ප්‍රතිසන්නද්ධ කිරීමට උත්සාහ දැරූ ලෙනින් ද බොල්ෂෙවික් පාක්ෂිකයන්ව සිටි දකුනු-මෙන්ෂෙවික කන්ඩායමක් ද අතර දිගුකල් පැවති අරගලයක් සිදුවූ බව කියා පෑම සාවද්‍ය ය. සත්‍ය වශයෙන් ම 1917 සිද්ධීන් පිලිබඳ ලෙනින්ගේ විශ්ලේෂනය ගලා ආවේ දිගු කලක් ලෙනින් දරා සිටි රුසියන් විප්ලවය පිලිබඳ න්‍යායකිනි. තමාගේ වර්ධනය වන්නා වූ මූලෝපායේ නිරවද්‍ය භාවය පිලිබඳ ව තම සගයන් ඒත්තුගන්වා ගත් පසුව ලෙනින් ද පක්ෂය ද ට්‍රොට්ස්කි හෝ ට්‍රොට්ස්කිවාදයේ බලපෑමට කුමන ආකාරයකින් හෝ පාත්‍ර වූයේ නැත.
>
> "සත්තකින්ම, ට්‍රොට්ස්කි විරෝධී විෂයය පවත්නේ ය. 1917 ට පෙර ද ලෙනින්වාදයේ හා ට්‍රොට්ස්කිවාදයේ සම්පූර්න

ඉතිහාසයට ට්‍රොට්ස්කිවාදයට විරුද්ධවීම පිලිබඳ ඉතිහාසයක් විය. අවාසනාවකට මෙන් වටහා ගැනීමට ට්‍රොට්ස්කි අසමත් වූ කරුන නම් 1917 දී තමා සාර්ථකත්වයක් අත්කර ගත්තේ බොල්ෂෙවික් පක්ෂයේ මෙහෙයීම යටතේ ක්‍රියාකල නිසා බවය. ඔහු බොල්ෂෙවික්වාදියෙකු වීමට මුලුමනින් ම කැපවීගත්තේ නැත. ඔහු එසේ කලේ නම්, මුලුමනින්ම වෙනස් ඉතිහාසයක් රචනය කරනු ඇත. උදාහරනයක් හැටියට ට්‍රොට්ස්කි තමාගේ අතීත හා වඩාත් මෑත න්‍යායික හා සංවිධානාත්මක වැරදි පිලිගනු ඇත. ට්‍රොට්ස්කිවාදය සහ ලෙනින්වාදය අතර තථ්‍ය සම්බන්ධතාවය ද ට්‍රොට්ස්කිවාදයේ පාපයන් වලක්වාගත හැක්කේ කෙසේ ද යන්න ද තරුනයන් විසින් වටහා ගනු ලබනු ඇත්තේ මේ ආකාරයට ම පමනි. 'ඔක්තෝබරයේ පාඩම්' වනාහී ලෙනින්වාදය වෙනුවට ට්‍රොට්ස්කිවාදය ආදේශ කිරීමට ට්‍රොට්ස්කි විසින් දරන ලද ප්‍රයත්නයකි. ඔහුට මෙය ඉටු කර ගැනීමට බොල්ෂෙවික් පක්ෂය ඉඩ තැබුවේ නැත. ට්‍රොට්ස්කි ගොවි ජනතාව අවුතක්සේරු කිරීම මගින් ප්‍රකාශිත අන්තරායන් ද ජර්මනිය සමග සාම සාකච්ඡාවල දී ඔහු දැරූ සාවද්‍ය පිලිවෙත් ද වෘත්තීය සමිති පිලිබඳ ප්‍රශ්නයේ දී හා මූල්‍ය ක්‍රමය ප්‍රතිසංස්කරනය කිරීම පිලිබඳව ප්‍රශ්නයේ දී සිදු වූ විවාදයන් තුලින් ප්‍රකාශිත වූ ට්‍රොට්ස්කිවාදය පිලිබඳ අන්තරාය ද නායකත්වය විසින් වටහා ගන්නා ලදී."[50]

මෙම ඡේදයන් වැදගත් වන්නේ ඒවා තමන් විසින් කරනු ලබන ඉතිහාස මුසාකරනය, -එනම්, වෛෂයිකයයි පෙනීයන ඓතිහාසික කථනයක් ට්‍රොට්ස්කිගේ මාරක දේශපාලන සතුරන්ගේ කන්ඩායම්වාදී ප්‍රකාශයන් යොදාගෙන නිර්මානය කිරීම - වසන් කිරීමට තැචර් විසින් යොදාගනු ලබන අතිශය-දුෂ්නිර්මිත ශෛලීය තාක්ෂනය ප්‍රදර්ශනය කරන හෙයිනි. ඉහත ඉදිරිපත් කරනු ලබන ඡේදයන්හි ලිඛිත සෑම දෙයක් ම යථාසම ව ම මුසාවකි. තැචර් ට්‍රොට්ස්කි පිලිබඳ මෙම "විවේචන" ගොනු කර ගෙන ඇත්තේ ස්ටැලින්, සිනොවියෙව්, සහ කමනෙව් විසින් රුසියානු විප්ලවයේ තීරක වර්ෂය වූ 1924 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල දී බොල්ෂෙවික් පක්ෂය තුල පැන නැගි දේශපාලන මතභේද හා අරගල පිලිබඳ ව ට්‍රොට්ස්කි විසින් කරන ලද දීප්තිමත් විශ්ලේෂනය අවමානයට පාත්‍ර කිරීම සඳහා ස්ටැලින්, සිනොවියෙව් සහ කමනෙව් විසින් ලියන ලද මහා මුසා ප්‍රහාරයන් රොත්තකිනි.

ට්‍රොට්ස්කිගේ *ඔක්තෝබරයේ පාඩම්* නම් කෘතිය සිනොවියෙව්, කමනෙව් සහ ස්ටැලින් 1917 විවිධ අවස්ථාවල දී ලෙනින්ට එරෙහිව පිහිටුවා ලූ ද එහෙයින් ම එළිදරව් කිරීමට ඔවුන් බෙහෙවින්ම අකැමැති වූ ද දක්ෂිනාංශික සම්මුතිවාදී පිලිවෙත් පිලිබඳ සිද්ධි හා විවාද විග්‍රහයට භාජන කලේ ය. 1917 මාර්තු මස දී ලෙනින් රුසියාවට පෙරලා පැමිනීමට පෙර ස්ටැලින් හා කමනෙව් මෙන්ෂෙවික්වාදීන් සමග පෙල ගැසී සිටියාහ. 1917 ඔක්තෝබරයේ දී කමනෙව් සහ සිනොවියෙව් සන්නද්ධ නැගිටීමට එරෙහි වී තිබුනි. එමතු නොව 1917 බොල්ෂෙවික ජයග්‍රහනය අත්පත්කර ගැනීමේ දී ට්‍රොට්ස්කිගේ භූමිකාවට සම වූයේ ලෙනින් ඉටු කල ක්‍රියා කලාපය ම පමනි. ඉහත උද්ධෘත ඡේදවල තර්ක මවනු ලැබුවේ *ඔක්තෝබරයේ පාඩම්* කෘතියේ ඉදිරිපත් වූ ට්‍රොට්ස්කිගේ විවේචනවල අනුහස වලක්වාලීමට ද විප්ලවවාදී නායකයෙකු වශයෙන් ඔහුගේ කීර්තිය විනාශ කිරීමට ද වේ. ඉතිහාසඥ රොබර්ට් වී. ඩැනියෙල්ස් ලියා ඇති පරිදි, ඔක්තෝබරයේ පාඩම්වලට ප්‍රතිචාරයක් වශයෙන් ට්‍රොට්ස්කිට එරෙහිව එල්ල කරන ලද චෝදනා වනාහී "මුලුමනින්ම මවා පෙන්වන ලද එසේත් නැත්නම් සීමාව ඉක්මවා අතිශයෝක්ත ඒවා ය. දුෂ්කෝපයට පත් නායකයන් විසින් විනාශකර දමිය යුතුයැයි තීන්දු කරනු ලැබූයේ මිනිසා මිස, න්‍යායික වැරැද්දක් නොවේ."[51] කෙසේ වෙතත් තැචර්, ට්‍රොට්ස්කිට එරෙහිව එල්ල වූ ප්‍රහාරයේ සන්දර්භය පැහැදිලි කරන්නේ නැති අතර එහි සංසිද්ධික වලංගු බවට අභියෝග කරන්නේ ද නැත. ඔහු බොරු හා ප්‍රබන්ධයන් ඉදිරිපත් කිරීමේ දී කල්පනාකාරී සමබර ඉරියව්වක් පෙන්වාගෙන සිටී. නිලධරයේ දැවැන්ත අවලාද - ව්‍යායාමය පිලිබඳ ව තැචර් යොදා ගන්නා අල්පෝක්තිය වන "ට්‍රොට්ස්කි විරෝධී ප්‍රශ්නය"- යන්න යුක්තියුක්ත භාවය, ගෞරවය, සහ සුජාත භාවයෙන් සමන්විත වේ. මෙහි ප්‍රතිඵලය ලෙස තැචර් තම කෘතියේ පිටු තුල ප්‍රාදුර්භූත වෙමින් පැවැති සෝවියට් නිලධරය ට්‍රොට්ස්කිට එරෙහි තම අරගලය නිර්මානය කලා වූ දේශපාලනික හා ඓතිහාසික සාවද්‍ය කරනයන් දමාලන කුනු බක්කියක් ලෙස යොදා ගැනීමට ඉඩ සලසා දෙයි. මෙම පැරනි බොරු, වෛෂයික ඉතිහාස කථනයක් සේ මවා පෙන්වන අලුත් දවටනයක ඔතා ඉදිරිපත් කරන යටිකුට්ටු හා වංචනික තාක්ෂනෝපායක් තැචර් විසින් නැවත නැවතත් යොදා ගනු ලැබේ.

## 1905 පිලිබඳ 'මිථ්‍යා ප්‍රබන්ධය'

ස්වේන් මෙන් ම, තැචර් ද 1905 විප්ලවයේ දී ඔහු ට්‍රොට්ස්කි ඉටු කල භූමිකාව වැනි, ඔහුගේ ජීවිතය පිලිබඳ "තීරනාත්මක මිථ්‍යා ප්‍රබන්ධ" එළිදරව් කරලීමට සපථ කරයි. මහාචාර්ය තැචර් මේ වැඩයට බැස ගන්නේ කෙසේ ද යන්න පරීක්ෂා කර බලමු. 1905 විප්ලවයේ දී ට්‍රොට්ස්කි ඉෂ්ට කලා වූ කේන්ද්‍රීය භූමිකාව ලෝකය පුරා ම විද්වතුන් විසින් සාර්වත්‍රිකව පිලිගනු ලැබ ඇත.

ඒ නිසා, එම විද්වත් සම්මතියට එල්ල කෙරෙන අභියෝගයක් සඳහා නව කරුනු සහ තර්ක පරෙස්සමින් ඒකරාශී කොට ගැනීමක් අවශ්‍ය බව තැචර් වටහාගන නැතයි සිතිය හැකි ය. එහෙත් එම ප්‍රයුක්තියට ප්‍රකාශකයාගේ හැඳින්වීමේ දක්වා තිබෙන අවධානය නොතකා ම (එම හැඳින්වීම වෙලුමේ පිටකවරයේ ද උපුටා දක්වා තිබේ.) තැචර් 1905 ට්‍රොට්ස්කිගේ භූමිකාව "මිථ්‍යා ප්‍රබන්ධ හරනයට" පාත්‍ර කිරීම සඳහා යොදා ඇත්තේ සාපේක්ෂ වශයෙන් කෙටි එක් ඡේදයක් පමනි.

තැචර් මෙසේ අරඹයි, "'1905 විප්ලවයේ ගමන් මග මත ට්‍රොට්ස්කි කල නිශ්චිත බලපෑම කුමක් ද?' යන්න තක්සේරු කිරීම දුෂ්කරය." සැබැවි; නිශ්චිත බලපෑම කුමක් ද යන්න නිර්නය කිරීම අමාරු විය හැකිය. එහෙත් ඔහුගේ බලපෑමේ ප්‍රමානය සහ පරිමාව පිලිබඳ සමහර, තතු දත් නිගමනවලට එලඹීමට ඉඩ සලසන, සැලකිය යුතු තොරතුරු සම්භාරයක් ට්‍රොට්ස්කි දරා සිටි අධිකාරවත් ආරෝහය පිලිබඳව දෙස් දෙයි. මෙම කාල පරිච්ඡේදයෙන් එන නානා චරිත ලේඛන ද ඇතුලත් ය. ට්‍රොට්ස්කි පීට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේ සභාපති විය, ඔහු එකල්හි පුවත් පත් දෙකක් ද සංස්කරනය කලේ ය. *රුස්කායා ගැසෙටා* සහ *නචාලෝ* යන එම පුවත්පත් දෙකම විශාල ජනප්‍රිය සංසරනයක් අත්කර ගත්හ. මෙම විරුද්ධත්වය කල්තබා අපේක්ෂා කරන්නාක් මෙන්, තැචර් මෙසේ කියාපායි, "ඔහුගේ පුවත්පත් කලාවේදය කී දෙනෙකුට බලපෑවේ ද යන්න දැන ගැනීමට අපට ක්‍රමයක් නැත."[52] මෙ ද අසත්‍යයකි. 2005 සැප්තැම්බරයේ දී තමාගේ ම නමින් "*හිස්ට්රි රිවීව්*" නමැති සඟරාවේ පලවූ ලිපියක, මෙම පුවත්පත් දෙකේ සංසරනය ලක්ෂයකට පමන ඉහල නැග තිබෙන්නට ඇතැයි ද තරගකරු ප්‍රකාශනවල සංසරනයට වඩා අඩු වශයෙන් 20,000කින් වත් වැඩි වන්නට ඇතැයි ද [53] තැචර් ම පිලිගනී. තැචර් ඉක්බිති 1905 විප්ලවය තුල ට්‍රොට්ස්කිගේ දේශපාලන බලපෑම පිලිබඳ ප්‍රයුක්තියට අදාල නොවන අලුත් තර්ක පොටක් ඉදිරිපත් කරයි. "ඔහුගේ වචන බොහෝ ගොවියන් වෙත ලඟාවීමට පැවැති ඉඩකඩ සීමා සහිත ය. ඔහුට ගම්මාන සමග සබඳකම් සරලව ම තිබුනේම නැත. ඔහුගේ ආයාචනයන් ගොවි ජනතාව අතර පලල් ලෙස බෙදා හැරීමක් තිබුනේ ද නැත."[54] ඇත්ත වශයෙන් ම මෙය කරුනට අදාල නැත. ට්‍රොට්ස්කිගේ ද සමස්තයක් වශයෙන් රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ ද බලපෑම 1905 දී ඉහල නැංගේ පෘථුල නාගරික කම්කරු පන්තික ජනකායේ පදනම මත ය. සෙන්ට් පීටර්ස් බර්ග් සෝවියට් සභාව කම්කරු පන්තියේ දේශපාලන අවයවයක් විය. එය 1905 ඔක්තෝබර් මහා වැඩ වර්ජනය ද ඇතුලත් කර ගත් කම්කරු පන්තික විප්ලවවාදී ක්‍රියාකාරකම් රැල්ලක් මත්තේ පැන නැංගේ ය. එසේ වුවද ගොවි ජනතාව මහා පරිමානයෙන් පෙරලිකාරීත්වයට එකතු වූයේ 1906 දී පමන, සමාජවාදී නායකත්වය ලද කම්කරු පන්ති ව්‍යාපාරය ශාරීරිකව මර්දනය කර දැමීමෙන් පසුව ය.

තැචර් තවදුරටත් මෙසේ ලියාගෙන යයිඃ " තමාගේ ප්‍රධාන සෝෂක ක්ෂේත්‍රය වූ අගනුවර තුල පවා ට්‍රොට්ස්කි කිසියම් විශේෂිත ආයතනයක් හෝ කන්ඩායමක් ගොඩනගා ගත්තේ නැත. උදාහරනයක් හැටියට කම්කරු නියෝජිතයන්ගෙන් සමන්විත වූ සෝවියට් සභා පැනනැගීමේ දී පවා, - *සහාභාගී වූ එක් අයෙක් වාර්තා කරන පරිදි "ඔහු පසුව පීටර්ස්බර්ග් සෝවියට් සභාවේ මෙන්ෂේවිකයන්ගේ අනභියෝගී නායකයා"ව සිටියා විය හැකි වුවද*[55] - මෙහෙයුම්කාරක බලවේගය වූයේ නැත. ගොවි ජනයා පිලිබඳ ප්‍රශ්නය මෙන් ම, ට්‍රොට්ස්කිගේ කන්ඩායමික සම්බන්ධතාවය පිලිබඳ ප්‍රශ්නය ද තැචර් මෙතැනට ඇද ගන්නේ ස්ථාපිත ඓතිහාසික වාර්තාවට එරෙහිව ආස්ථානයක් තහවුරු කර ගැනීමට මිස අන් යම්කිසි හේතුවක් නිසා නොවේ. එවක රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ ඉතිහාසයෙහි කාන්ඩායමික අනන්‍යතා පසුව 1917 දීට වඩා ඉතා බෙහෙවින් ලිහිල් තත්වයක පැවැතුනි. ප්‍රධාන දේශපාලන කන්ඩායම් දෙකින් ඔහු ස්වාධීනව සිටි ප්‍රමානයට සත්තකින්ම ට්‍රොට්ස්කිගේ දේශපාලන ආස්ථානය ශක්තිමත් කරනු ලැබී ය. අප තැචර්ගේ විරූප සූත්‍රය සැලකිල්ලට ගනිමුඃ "ට්‍රොට්ස්කි පසුව සෝවියට් සභාවේ මෙන්ෂෙවික්වරුන් අතර අනභියෝගී නායකයාව සිටියා විය හැකිය." "පසුව සිටියා විය හැකි?" පමනි. තැචර්ට එවන් සාක්ෂ්‍යයක් සොයා ගැනීමට හැකි වී නම්, ඔහු එය අඬබෙර ගසා පතුරවනු නිසැක ය. ඔහු ප්‍රතිවිරුද්ධ සාක්ෂ්‍යයක් ඉදිරිපත් නොකරයි; එහෙත් අලුත් තර්කයක් ගෙතීමට ගමන් කරයි. "එකල්හි අගමැතිව සිටි විට් ගේ මතක සටහන්, ට්‍රොට්ස්කි ගැන සඳහන් කිරීමට පවා වටනේ යයි තකන්නේ නැත. --- මින් හුදෙක් තහවුරුවන්නේ එකල්හි ජනප්‍රිය විඥානය මත ට්‍රොට්ස්කි ඇතිකලා වූ සීමිත බලපෑම ය."[56]

මෙය වනාහී කපටි තක්කඩියෙකුගේ ම මිස සුපරීක්ෂ වියතෙකුගේ තර්කයක් නම් නොවේ. සාර් රජුගේ අගමැතිවරයා වූ කවුන්ට් විට් තම මතක සටහන්වල ට්‍රොට්ස්කි ගැන සඳහන් කලේ නැත. තැචර් මෙම තනි අංගයට අත්‍යාසාමාන්‍ය ඓතිහාසික අර්ථභාරයක් පටවයි. තැචර් කියා සිටින්නේ විට් විසින් ට්‍රොට්ස්කිව සඳහන් නොකිරීම මගින් අපට 1905 ශරදයේ මහජන සන්තානය තුල ට්‍රොට්ස්කි දරාසිටි තැන ගැන දුරදිග යන නිගමනයන් කරා එලඹීගත හැකි බවකි. කෙනෙකුට මෙසේ ඇසිය හැකියඃ මාලිගා ද යෝධ තුරුලතා ගහන වතුපිටි ද පුරුදු කවුන්ට් විට් ට වඩා සෙන්ට් පීටර්ස්බර්ග් හි කම්කරු ප්‍රදේශවල සිදුවෙමින් පැවැති දේ කෙරේ සමීප වූ පුද්ගලයන් විසින් ලියන ලද වෙනත් මතක සටහන් ගැන කුමන

සඳහනක් හෝ කිරීමට නැවර් අසමත් වූයේ මන් ද? තමන්ගේ තර්කයට එරෙහිව යන ඓතිහාසික සාක්ෂ්‍ය සැඟැවීම හෝ නොතකා හැරීම බුද්ධිමය සදාචාරයෙන් තොරබවේ ද සදොස් වියත් බවේ ද ආවේනික ගති ලක්ෂනයකි. එහෙත් නැවර් හරියට ම කර ඇත්තේ ද මෙයම යි. උදාහරනයක් හැටියට, බොල්ෂෙවික් කන්ඩායමේ සාමාජිකයෙකු ලෙස 1905 විප්ලවයට සහභාගී වූවෙකු වූ ඇනටෝලි ලූනචාර්ස්කිගේ මතක සටහන් තම ශිෂ්‍ය පාඨකයන්ගේ අවධානයට ලක් කල යුතුව තිබුනි. ලූනචාර්ස්කි තමාගේ සුපුකට රෙවලූෂනරි සිලුට්ස් (විප්ලවීය සිලුවට) නම් කෘතියේ දී 1905 ට්‍රොට්ස්කිගේ භූමිකාව පිලිබඳ සිය ඇගැයුම මෙසේ ඉදිරිපත් කලේයඃ

> "ඔහුව සිර භාරයට ගනු ලැබූ අවස්ථාවේ දී පීටර්ස්බර්ග් කම්කරු පන්තිය තුල ඔහුගේ ජනප්‍රියත්වය අතිමහත් වූ අතර උසාවිය ඉදිරියේ ඔහුගේ විචිත්‍ර හා වීර හැසිරීම එය තවදුරටත් ඉහල දැමී ය. 1905-6 සියලු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් අතරින් ට්‍රොට්ස්කි සිය තුරුනු විය නොතකාම, අතිශයින්ම සැදී සූදානම් ව සිටි තැනැත්තා ලෙස කැපි පෙනුනේ ය. මා කියා ඇති පරිදි එකල්හි ලෙනින්ට පවා බලපෑවා වූ විදේශගත වූවන්ට පොදු ව තිබුනු කිසියම් වර්ගයක පටුභාවයක අඩයාලම ට්‍රොට්ස්කි කෙරේ බලපෑවේ අන් සියල්ලටමත් වඩා අඩු වශයෙනි. ජාතික පරිමානයක දේශපාලන අරගලය පවත්වා ගෙන යෑමේ අර්ථය කුමක් දැයි ට්‍රොට්ස්කි අන් සියල්ලටමත් වඩා මැනවින් දැන සිටියේ ය. ඔහු විප්ලවයෙන් ඉස්මත්තට පැමිනුනේ ඉමහත් ජනප්‍රියතාවක් අත්පත් කර ගෙන ය. ඒ අතර ලෙනින් හෝ මාර්ටොව් සඵලව එවැන්නක් දිනා ගැනීමට අසමත් වුහ. අර්ධ-කැඩට් ප්‍රවනතා ප්‍රදර්ශනය මගින් ප්ලේඛානොව් (සිය කීර්තිය) බෙහෙවින් හීන කර ගති. එකල්හි ට්‍රොට්ස්කි නැගී සිටියේ මුල් පෙලෙහි ම ය."[57]

ලූනචාර්ස්කි, සෙන්ට් පීටර්ස්බර්ග් සෝවියට් සභාවේ බලගතු පුද්ගලයා ලෙස ලෙනින් ඉදිරියේ ම ට්‍රොට්ස්කි ප්‍රසංශාවට භාජනය කෙරුනු අවස්ථාවක් ද මතකයට නැංවී ය. මෙකල්හි ලෙනින් සහ ට්‍රොට්ස්කි අතර කන්ඩායමික අරගලයක් පැවති අතර එහෙයින් ලෙනින් සිය ප්‍රතිමල්ලයාගේ දේශපාලන විජයග්‍රහනය අවශ්‍යයෙන් ම ආස්වාදනය කලේ ද නොවේ. ලූනචාර්ස්කිට අනුව "ලෙනින්ගේ මුහුන මොහොතකට අඳුරුවන් වූ අතර ඉක්බිති ඔහු මෙසේ කීයඃ ඉතින්, ට්‍රොට්ස්කි එම තත්වය අත්පත් කර ගත්තේ තමාගේ දීප්තිමත් සහ අප්‍රතිහත වැඩ කටයුතු මගිනි."[58]

නැවර් සඳහනක් සඳහන් නොකිරීමට වගබලා ගත් තවත් තත්කාලීන මතක සටහනක් වේ. මෙන්ෂෙවික් නායක තියඩෝර් ඩෑන්ගේ වන - එය 1905 දී ට්‍රොට්ස්කි දරා සිටි ඉමහත් දේශපාලන බලපෑම පිලිබඳ කිසිදු සැකයකට ඉඩ තබන්නේ නැත. ඒ වන විට ට්‍රොට්ස්කි හා සමග සම්බන්ධ කොට සලකන ලද්දා වූ දේශපාලන ඉදිරි දර්ශනය - විප්ලවයේ කම්කරු පන්තික සහ සමාජවාදී ස්වභාවය වටහා ගැනීම - බොල්ෂෙවික් හා මෙන්ෂෙවික් යන ප්‍රවනතා දෙකෙන්ම සැහෙන්නට බලවත් කොටස්වල පරිකල්පනය ආකර්ෂනය කර ගත්තේ ය. ඩෑන් මෙසේ සිහි කලේ ය.

> "ප්‍රායෝගිකව ගතහොත් මෙන්ෂෙවික් හා බොල්ෂෙවික් ප්‍රවනතා දෙක ම " ට්‍රොට්ස්කිවාදය" දෙසට තල්ලු කැරිනි. ටික කලකට (එවකට සත්තකින්ම, නමක් නොදැරූ) "ට්‍රොට්ස්කිවාදය" රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතිහාසයෙහි ප්‍රථම වරට හා අවසන් වරට, එහි (රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙහි) ඒකාබද්ධක වේදිකාව බවට පත්විය. එහෙයින් (නොවැම්බරයේ දී) පීටර්ස්බර්ග් කම්කරු නියෝජිත සෝවියට් සභාවේ සභාපති සිරභාරයට ගැනීමෙන් පසුව, හරියට ම ට්‍රොට්ස්කි ම---, අනභියෝගීව, සෝවියට් සභාවේ පැවැත්මට ඉතිරිව තිබුනු කෙටි දින ගනන සඳහා ඔහුගේ ස්වභාවික අනුප්‍රාප්තිකයා ලෙස පත්විනි." [59]

1905 විප්ලවයේ, ට්‍රොට්ස්කිගේ භූමිකාව ප්‍රශ්නයට භාජනය කිරීමට තමා දරන ප්‍රයත්නය ප්‍රතිහනනය කරන්නා වූ ද නිෂ්ප්‍රභ කරන්නා වූ ද වැදගත් සියැ'සි සාක්ෂ්‍ය ගෙනහැර දැක්වීමට නැවර් අසමත්වීම, ඔහු විසින් ලියනු ලැබ ඇති (ට්‍රොට්ස්කිගේ) චරිතාපදානය අපකීර්තියට පත් කරයි; එ පමනක් නොව ඉතිහාසඥයෙකු ලෙස නැවර්ගේ අවංකභාවයට ද අඳුරු හෙවනැල්ලක් හෙලයි. මෙම සුවිශේෂ ප්‍රයුක්තිය එනම් 1905 ට්‍රොට්ස්කිගේ භූමිකාව විකෘත කිරීම, තනි එක් අවස්ථාවක් නොවේ; එය මෙම චරිතාපදානය පුරාම ට්‍රොට්ස්කි අපකීර්තියට භාජනය කිරීම සඳහා නැවර් යොදාගන්නා ක්‍රමවේදය නිදර්ශනය කරයි.

## පක්ෂාභ්‍යන්තර අරගලය පිලිබඳ නැවර්ගේ මුසාකරනය

1920 ගනන්වල මුල් භාගයේ දී රුසියානු කොමියුනිස්ට් පක්ෂය තුල පැන නැගි දේශපාලන අරගලය කෙරේ නැවර් දක්වන ආචරනය (treatment) වනාහී උගත් ඉතිහාස රචනය උල්ලංඝනයකි. හැඳින්වීමේ දී මෙන් ම මෙහිදී ද ට්‍රොට්ස්කිගේ කන්ඩායම්වාදී විරුද්ධවාදීන්ගේ තර්ක ඓතිහාසික සිද්ධීන් පිලිබඳ වෛෂයික සංග්‍රහයක් යයි මවා

පෙන්වීමට තැචර් ඇතුලත් කර යොදා ගනියි. උදාහරනයක් හැටියට 1923 ඔක්තෝබරයේ දී පක්ෂාභ්‍යන්තර අරගලය පුපුරායාම ගැන වූ චරිතාපදානයේ තීරනාත්මක කොටසක තැචර් මෙසේ ලියයි. *"තමාගේ ක්‍රම විධීන් මගින් පමනක්ම සුරක්ෂිත* තරනයක් (එගොඩ වීමක්) සහතික කරගත හැක්කා වූ නව යුගයකට පක්ෂය ඇතුලුවෙමින් පවතින්නේ යයි විශ්වාස කල 'ට්‍රොට්ස්කි', සිය ප්‍රති-නිලධර ක්‍රියාමාර්ගය *ඔහුට සුපුරුදු වූ හදිසි බවින් ද ආවේගයෙන් ද යුක්තව* දියත් කලේ ය."[60] තැචර් තවදුරටත් ලියාගෙන ගියේ යඃ

> "එහෙත් පක්ෂයේ ප්‍රධාන මන්ඩලවල සිටි ඔහුගේ සගයෝ මෙය ඒත්තු නොගත්හ. ට්‍රොට්ස්කි විස්තර කල තරම් සැබැවින්ම තත්වය නරක් වී නැතැයි ඔවුහු සැක කලහ. ඔව්, ආර්ථික ප්‍රශ්න තිබුනු බව සැබවි, එහෙත් ඒවා බොහෝ දුරට කලින් අපේක්ෂා කරන ලද ඒවා ය. කෙසේ වෙතත් බිඳ වැටීමක ආසන්න තර්ජනයක් පැවැතුනේ නැත. ආර්ථිකය මුලුමනින්ම නිරවද්‍ය කර ගෙන ඇතැයි කීමට හැකිවන්නට පෙර, දුෂ්කර හා ස්ථිරසාර වැඩවලින් යුතු වසර ගනනාවක් පක්ෂය අපේක්ෂා කලේ ය. පක්ෂය දෙස බැලූ ට්‍රොට්ස්කිගේ සහෝදරවරු කාර්යධරයන් නව පරපුරක් උගන්වා ගැනීමට හැකි වීම ගැන තමන්ට ස්තුතිකර ගැනීමට හැකි යයි කියා පෑහ. මෙම අලුත් ලේ ලැබීම වැදගත් කර්තව්‍යයන් විසඳා ගැනීමට නිසැක ව ම උදව් වනු ඇත. පරිකල්පිත ව්‍යාධීන් රැසක් පාලන තන්ත්‍රය අරක්ගෙන ඇතැයි යන ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය ප්‍රතික්ෂේප කල, පැරනි බොල්ෂෙවිකයන්ගෙන් බහුතරය මනා, සාර්ථ පිලිවෙත් වර්ධනය කිරීම උදෙසා ඔහු කෙරේ විශ්වාසයක් තැබිය හැකිදැයි සැකයෙන් බැලූහ. දුෂ්කරතා අතිශයීකරනයට යොමු වූ ට්‍රොට්ස්කි විසඳීම් ඉදිරිපත් කිරීමේ දී හා තම විසඳුම්වල දී බෙහෙවින් ම අපැහැදිලි විය. පොලිට්බියුරොවේ (දේශපාලන කමිටුවේ) බහුතරයකට නම් ට්‍රොට්ස්කි ගැටලුවට විසඳුමක් නොව ගැටලුවේ ම කොටසක් විය. උදාහරනයක් හැටියට ක්‍රමානුකූල නායකත්වයක් නැතිකම ගැන මනස්තාපය ප්‍රකාශ කල ද ඔහු කවුන්සිල් ඔෆ් ලේබර් ඩිෆෙන්ස් (කම්කරු ආරක්ෂක මන්ඩලය) සහ කැබිනට් මන්ඩලයේ වැදගත් රැස්වීම්වලට සහභාගී නොවූයේ මන්ද? ට්‍රොට්ස්කිගේ වැඩ පුරුදුවල කැප වී කටයුතු කිරීමක් පිලිබඳ ඇඟැවීමක් පැවැතුනේ නැත. එපමනක් නොව ඔහුගෙන් සංයුක්ත යෝජනා ඉදිරිපත් නොවීම කැපී පෙනුනි. මෙය කිසිසේත්ම පුදුමයක් වූයේ නැත. මන්දයත්, ඔහුගේ පිලිවෙත් වාර්තාව කිසිසේත්ම පිලිගත හැක්කක් නොවූ හෙයිනි. මෑත සමයේ ලෙනින්ට එරෙහිව ට්‍රොට්ස්කි, වෙනත් කරුනුවලට අමතර ව, බ්‍රෙස්ට් ලිටොව්ස්ක් සාමය සහ වෘත්තිය සමිති යනාදී ප්‍රශ්න සම්බන්ධයෙන් පරාජයන් ගනනාවකට මුහුන දී තිබුනි. ඔහුගේ සහකරුවන්ට අනුව ට්‍රොට්ස්කිගේ අතෘප්තිය යථාර්ථය තුල මුල් බැස ගත්තක් නොව, පෞද්ගලික අපේක්ෂා භංගයන් ගනනාවක් විසින් ඇති කැරුනු උද්ධච්ච සිත්වේදනාවක් තුලින් පැනනැගුනක් විය. මේ අනුව එක්දහස් නමසිය විසිතුනේ අප්‍රේල් මාසයේ දී 12 වන සමුලුව ආගමික කටයුතු පිලිබඳව තමාගේ වඩාත් සටන්කාමී ප්‍රවිෂ්ටය පරාජය කල කල්හි ට්‍රොට්ස්කිට සතුටට පත් විය නොහැකි වන්නට ඇත. 1923 සැප්තැම්බරයේ දී යුද්ධ-විප්ලව කමිටුවේ (මිලිටරි රෙවලූෂනරි කමිටි) සිදුකරන ලද පුද්ගල මාරුව නිසා ට්‍රොට්ස්කි සත්තකින්ම වික්ෂෝභයට පත්විය. අවසාන වශයෙන්, අන් සියල්ලටමත් වඩා ට්‍රොට්ස්කි අමනාප වූයේ ඔහුට ඒකාධිපති බලතල පැවරීමට මධ්‍යම-කාරක සභාව දැක්වූ විරුද්ධත්වය නිසා ය. ට්‍රොට්ස්කිගේ පදනම් විරහිත විවේචන වැදගත් පක්ෂ වැඩ කටයුතු අනවශ්‍ය කඩාකප්පල් වීම්වලට භාජනය කරමින් වැඩිමහලු හා බාල පරපුර දෙක අතර යුද්ධයක් පැන නැංවීමේ තර්ජනය දරා සිටින පක්ෂ-විරෝධී වේදිකාවලට ධෛර්යයක් සපයන බවට ට්‍රොට්ස්කිට අනතුරු හඟවන ලදී."[61]

තැචර් විසින් ලියන ලද පරිදි මෙම ඡේදය, -අල්පොක්තියෙන් "ට්‍රොට්ස්කිගේ සහෝදරවරුන්" ලෙස සඳහන් කරනු ලැබූ දේශපාලන කමිටුවේ බහුතරය - ට්‍රොට්ස්කිගේ විවේචනයන්ට සංයත හා යුක්ති සහගත ප්‍රතිචාර දැක් වූ බවක් අඟවා සිටී. එයට (දේශපාලන කමිටුවේ බහුතරයට) ට්‍රොට්ස්කි එල්ල වූයේ ඉලක්ක රහිත ගජනාවක් ලෙසට ය. ඔහු සමග වැඩ කිරීම කල නොහැකි වී නම්, දුෂ්කර හෝ විය. අතිශයෝක්ත අනතුරු හැඟවීම් හා අහේතුක ඉල්ලීම් මගින් ට්‍රොට්ස්කි තම "සගයින්ට" නොනවත්වා ම කරදර කලේ ය. ඒ අතර ම වගකිව යුතු වූ පැවරීම් ඉටු නොකර පැහැර හැරියේ ය. එපමනක් නොව, ට්‍රොට්ස්කිට යථාර්ථය පිලිබඳ ව පැවැත්තේ දුබල ග්‍රහනයකි. ලෙනින් සමග පවා කලබල අවුස්සා ගැනීමේ ඉතිහාසයක් ඔහුට පැවැතුනි. ඔහු ප්‍රේරනය වූයේ ආත්මීය අමනාපයකිනි, ඔහු පිලිබඳ ව අන් සියල්ලට ම වඩා නපුරු කාරනය වූයේ ඒකාධිපති බලතල ඉල්ලා සිටීම ය. තැචර්ගේ ඉදිරිපත් කිරීම විසින් ඔහු තම ශිෂ්‍යයන් යොමු කරන්නේ

ට්‍රොට්ස්කි ද ඔහුගේ දේශපාලන කටයුතු ද පිලිබඳ ඝන මතයක් ගොඩනගාගැනීම කරා ය.

මෙහිදී තැචර් තම පාඨකයන්ට දැනුම් දී නැති කරුනක් ඇත. එනම් ඉහත - උධෘත ඡේදය වනාහී - තැචර් "සහෝදරයන්" හා "සගයන්" යයි පාඨකයාගේ ඇස්වලට වැලි ගසන පරිදි නම් කරන - ට්‍රොට්ස්කිගේ දේශපාලන තික්ත හතුරන් විසින් සම්පාදනය කරන ලද වංචනික ලෙස කන්ඩායම්වාදී වූ ද සදාචාරාත්මක මූලධර්මවලට පටහැනි වූ ද ලියවිල්ලක්, තැචර් විසින් ම ප්‍රවනතාත්මක ලෙස වෙනත් වචනවලින් යලි හැඩගස්සා ඉදිරිපත් කිරීමක් බව ය. එම ලියවිල්ල 1923 ඔක්තෝබර් 8 වැනි දින ට්‍රොට්ස්කි විසින් ලියන ලද වැදගත් ලිපියකට ද 1923 ඔක්තෝබර් 15 දින ඉදිරිපත් කෙරුනු 46 දෙනාගේ සුප්‍රසිද්ධ විරුද්ධවාදී ලිපියට ද ප්‍රතිචාර වශයෙන් නිර්මානය කැරුනකි. තැචර් උද්ධෘත ලක්ෂන හා අධෝ ලිපි ඉදිරිපත් කරන්නේ නැත. තමා එතරම් යහපත් මුහුනුවරක් දී සාරාංශ කරන තර්ක වනාහී කන්ඩායමික සතුරුබව විසින් ප්‍රේරිත බොරු හා බාගෙට ඇත්තවලින් පිරි මල්ලක් ය යන්න තැචර් අඟවන්නේ නැත.[62]

ඔහු තමාගේ පාඨකයන්ට දැනුම් නොදෙන කරුනක් නම් 1923 ඔක්තෝබර් 23 දින, (ට්‍රයම්වීරිස් - ත්‍රිපුද්ගලය - යන නමින් ප්‍රතිපත්ති රහිත ට්‍රොට්ස්කි-විරෝධී කන්ඩායමක් නිර්මානය කර ගෙන සිටි) සිනොවියෙව්, කමනෙව් හා ස්ටැලින් විසින් කරන ලද චෝදනා බන්ධනය කරමින් එම ලිපියට දවනසුලු ප්‍රතිචාරයක් සම්පාදනය කර තිබුනු බවය.

තැචර්ගේ සිතාමතා නොමග යවන ප්‍රවිෂ්ටය හඳුනා ගැනීමට නම් මෙම කරුනු (අඩුගනනේ ඉන් 1950 ගනන්වල මුල් සමයේ එලිදැක තිබුනු කොටස) සමාලෝචනය කරන ඊ.එච්. කාර්ගේ *Interregnum* (අන්තර් රාජ්‍ය සමය) නැමැති කෘතිය පරිශීලනය කිරීම වුවත් සෑහේ. ත්‍රිපුද්ගලයට ට්‍රොට්ස්කි දුන් දවනසුලු පිලිතුරෙන් ඡේද උපුටා දක්වන කාර් මෙම ගනුදෙනුවේ දී සත්‍යය පැවැත්තේ කොතැනද යන්න ගැන සැකයක් ඉතුරු කරන්නේ නැත. [63]

## 13වන සම්මේලනයට ට්‍රොට්ස්කි කල දේශනය

චරිතාපදාන රචකයෙකු ලෙස (අයිසැක්) ඩොයිෂ්චර්ගේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහනයක් වූයේ එන්න එන්නම දුෂ්කර වූ තත්වයන් තුල (තමාට එරෙහිව එල්ල කරනු ලැබූ යෝධ ප්‍රතිගාමී නිලධර තන්ත්‍රයට එරෙහිව) ට්‍රොට්ස්කි ගෙන ගිය අරගලයේ ධීර-වීර බව ද කරුනා රසය ද ඔහු විසින් චිත්‍රනය කර ඇති ආකාරය යි. ඓතිහාසික වාර්තාව මකා දැමීම අධිෂ්ඨාන කර ගත් තැචර් කරන්නේ බැරෑරුම් ශාස්ත්‍රවේදයට නොහොබිනා වූ වාග් උගුල් යොදා ට්‍රොට්ස්කිගේ අරගලය පාච්චල් කොට එය පහත් කොට තකන්නා වූ හෙලා දක්නා වූ ආකාරයකට පින්තාරු කිරීම යි. මා යලිත් වරක් අවධානය යොමු කරන්නේ තැචර් උද්ධෘතයන් යොදාගන්නා රැවටිලිකාරී ආකාරය වෙතට ය. 1924 මැයි මස දහතුන්වන පක්ෂ සම්මේලනය අමතා ට්‍රොට්ස්කි කල ප්‍රධාන කතාව සඳහන් කරන තැචර්, එය, "'ඔහුගේ සම්පූර්න චර්යාවේ ම අදක්ෂතම කතාව ය'යි තර්ක කරනු ලැබ ඇතැ"යි [64] ලියයි. මෙම හානිකර නිගමනයේ මුල් කතුවරයා කවරෙක් වී දැයි කල්පනා කරන්නට මෙහිදී අපට සිදුවේ. එය ලියන ලද්දේ ඇතැම්විට (13වන) සමුලුවට සහභාගි වූ කෙනෙකු විසින් ද? එක්කෝ ට්‍රොට්ස්කිගේ සතුරෙක්, නැතිනම් මිතුරෙක් විසින් ද? එහෙත් ඇත්තට ම මෙම මූලාශ්‍රය දකින්නට ලැබෙන්නේ 1974 දී යුනිවර්සිටි ඔෆ් ටොරොන්ටෝ මුද්‍රනාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ තීන්දු (*Resolutions and Decisions of the Communist Party of the Soviet Union*) නම් වෙලුමේ ය. මෙම වෙලුමට 13වන සම්මේලනයේ ලියකියවිලි ගනනාවක් ද ඇතුලත් ය. එයට කෙටි හැඳින්වීමක් ලියන මහාචාර්ය රිචර්ඩ් ග්‍රෙගර් මෙසේ සඳහන් කරයි. ට්‍රොට්ස්කි "තමාගේ චර්යාවේ අදක්ෂම දේශනය විය හැකි දේශනයක් කලේ ය."[65] ග්‍රෙගර් තමාගේ මෙම තක්සේරුවට සහාය දෙන කිසිදු තර්කයක් ඉදිරිපත් කරන්නේ නැත. එපමනක් නොව ග්‍රෙගර් වනාහී සෝවියට් දේශපාලනය පිලිබඳ අපක්ෂපාතී සහ මනා සේ කිරා මැන බලන ලද ඇගැයීමක් සඳහා පරිශීලනය කල යුතු ජාතියේ ඉතිහාසඥයෙක් නම් නොවේ.[66] ට්‍රොට්ස්කි පාච්චල් කිරීමේ තැචර්ගේ උපයෝගිතාවාදී අරමුන මිස අන් කවර හේතුවක් උදෙසා වුව 13වන සම්මේලනය පිලිබඳ ග්‍රෙගර් කල නොබැරෑරුම් සඳහන සාධිකාර නිගමනයක් ලෙස උපුටා දැක්වීමේ උවමනාකමක් ඇත්තේ නැත.

"හරි හෝ වැරදි වුවත් මෙයයි මගේ පක්ෂය, එය ගන්නා තීන්දුවලට මම අවසානය දක්වා වග කියන්නෙමි." යන නිතර උපුටා දක්වනු ලබන වාක්‍යාංශයෙන් සමාප්ත කරන ලද ට්‍රොට්ස්කිගේ 13 වන සම්මේලන දේශනය තැචර් විසින් පාච්චල් කරනු ලබන ආකාරය අපි තව දුරටත් පරීක්ෂා කර බලමු. තැචර් ම ට්‍රොට්ස්කිගේ දේශනයෙන් වාක්‍ය ගනනාවක් උපුටා දක්වයි; ඉහත දක්වන ලද වාක්‍යය ද ඊට ඇතුලත් ය. ඔහු ඉක්බිති මෙසේ ලියයි. "13වන සම්මේලනය ප්‍රතිට්‍රොට්ස්කිවාදී යෝජනාව තහවුරු කල අවස්ථාවේ ට්‍රොට්ස්කිට ඒ පිලිබඳ ගතු කීමේ ඉඩක් තිබිය නොහැකි විය."[67] මේ සියල්ල පෙනීයන්නේ හරි කෙලින් කතා ලෙස ය. "හරි උනත්, වැරදි උනත් මගේ පක්ෂය" යි කී ට්‍රොට්ස්කි, දැන් එම පක්ෂය තමාට විරුද්ධව යෝජනාවක් සම්මත කල අවස්ථාවේ දී ඊට විරුද්ධ වන්නේ කොහොම ද ?" එහෙත්, ට්‍රොට්ස්කිගේ එම දේශනයේ ඉහත උද්ධෘතයට වඩා බෙහෙවින් සූක්ෂම

හා සටන්කාමී වූ ඡේද තැචර් තම පාඨකයන්ට වසං කරයි. ට්‍රොට්ස්කි අවධාරනයෙන් ප්‍රකාශ කර සිටින්නේ සම්මත කරන ලද යෝජනාව කෙරේ තම විරුද්ධත්වය ය. ඔහු තමා වැරදි යයි සලකන පිලිවෙත්වලට එරෙහිව තර්ක කිරීමට ඇති තම වගකීම ද තහවුරු කරයි. [68] කපා කොටා කනපිට පෙරලනලද උධෘතයක් ඉදිරිපත් කිරීම මගින් ට්‍රොට්ස්කිගේ ආස්ථානය සාවද්‍යකරනය කර ඇති අතර ඔහුගේ සතුරන් විසින් ඔහුට එරෙහිව කරන ලද වැඩ යුක්තිසහගත කොට තිබේ.

## ලෙනින්-ට්‍රොට්ස්කි සම්බන්ධතාවය තැචර් මුසාකරනය කරයි

"ට්‍රොට්ස්කි සමග ලෙනින්ගේ සම්බන්ධතාවය බෙහෙවින් ගැටලු සහගත වී ය"යි තැචර් කියා සිටී. ඔහුට අනුව "1922 දෙසැම්බර් ලෙනින්ගේ දේශපාලන අන්තිම කැමති පත්‍රයේ දී ලෙනින් විසින් ට්‍රොට්ස්කිට වෙනත් කිසියම් සහෝදරයෙකුට වඩා ඉහල රෙකමදාරුවක් දෙනු ලැබුවේ නැත." මෙය අසත්‍ය ය. ට්‍රොට්ස්කිගේ "පමන ඉක්මවූ ආත්ම විශ්වාසය" ගැන ද "වැඩ කටයුතුවල සංවිධානාත්මක පැත්තේ පමන ඉක්මවා යෙදී ගැනීම" ගැන ද තම නොකැමැත්ත ප්‍රකාශ කරන ලෙනින් "ඔහු සමහර විට වත්මන් මධ්‍යම කාරක සභාවේ සිටුනා වඩාත්ම දක්ෂ පුද්ගලයා යයි..."[69] ප්‍රකාශ කලේ ය. එම අන්තිම කැමති පත්‍රය ම ස්ටැලින් විසින් "තම අතට අසීමිත අධිකාරයක් සංකේන්ද්‍රනය කර ගැනීම"[70] ගැන ද අනතුරු හැඟවී ය. ලෙනින් තම අන්තිම කැමැත්තට එකතු කල සුප්‍රසිද්ධ පසු පුරුව, ස්ටැලින් ප්‍රධාන ලේකම් ධුරයෙන් ඉවත් කල යුතුයයි මධ්‍යම කාරක සභාව උනන්දු කර ඇත. [71] එහෙත් තැචර් එය සඳහන් නොකොට අමතක කරයි. තැචර් ඉක්බිති මෙසේ ලියයි: "නායකත්වයේ තනතුර සඳහා තම අනුමැතිය ට්‍රොට්ස්කිට ලබා දීමට ලෙනින් කැමති වූයේ යයි සිතන්නට අමාරු ය, මන්ද යත්, 1922-23 දී ලෙනින්ගේ අදහස් ඉදිරිපත් කරවා ගැනීමට යුද කොමිසාර්වරයා (ට්‍රොට්ස්කි) මත විශ්වාසය තුබූ අවස්ථාවේ දී පවා ලෙනින් ඔහු ගැන සැකයෙන් සිටියේ ය. "ලෙනින් තමාට ලැබෙන ඊ ලඟ මොහොතේ ම ට්‍රොට්ස්කිව අතහැර දමනු ඇතැයි ලෙනින්ගේ චරිතාපදාන රචකයා අවධාරනය කර තිබේ."[72]

මෙය වනාහී සිතාමතාම නොමග යවන සාවද්‍ය ඉදිරිපත් කිරීමකි. ලිපි ලේඛන විශාල සංඛ්‍යාවකින් යුතු වාර්තාවක් මත පදනම් වූ ඓතිහාසික අධ්‍යයන ගනනාවකින් තහවුරු වී ඇති පරිදි ලෙනින්ගේ ජීවිතයේ අන්තිම මාස කිහිපය ස්ටැලින් කෙරේ වැඩෙන සැකයකින් හා විරුද්ධත්වයකින් සමන්විත විය. 1923 මාර්තුවේ දී ඔහුගේ දේශපාලන චර්යාව අවසන් කර දැමූ පක්ෂඝාත රෝගයට පෙර මාස හා සති තුල ලියූ ලේඛන ගනනාවක ලෙනින් ස්ටැලින් කෙරේ සිය වැඩෙන අවිශ්වාසය ප්‍රකාශයට පත් කලේ ය. එම කාල පරිච්ඡේදය තුල ම, ලෙනින් වඩ වඩාත් ට්‍රොට්ස්කිට ලංවිය. ලෙනින් (මේ වන විට) ට්‍රොට්ස්කි දැක්කේ ස්ටැලින්ට එරෙහි වැඩෙන අරගලයේ තමාගේ වැදගත් ම සහකරුවා ලෙසට ය. 1922 දෙසැම්බර් සිට 1923 මාර්තු දක්වා වූ තීරක කාල පරිච්ඡේදය තුල දේශපාලන වර්ධනයන් විවිධාකාර අර්ථකථනයන්ට ඉඩ හරිතැයි අප (මෙහොතකට) එකඟවුවත්, ලෙනින් තවත් කලක් ජීවත් වී නම් "ට්‍රොට්ස්කි ඉඩ ලැබෙන ඊ ලඟ මොහොතේ අත හැර දමනු ඇති ය" යන " ලෙනින්ගේ චරිතාපදාන රචකයා"ගේ සොයා ගැනීම යයි තැචර් කරන සඳහන තව දුරටත් අපගේ නොඑකඟතාවය ලබයි.

අදාල අධෝලිපියේ දක්වා ඇති ලෙනින්ගේ චරිතාපදාන රචකයා නම් රොබර්ට් සර්විස් ය. ඔහු ලෙනින් පිලිබඳ වෙලුම් තුනකින් යුතු අධ්‍යයනයක කර්තෘ ය. සර්විස් ලියූ චරිතාපදානයේ ගුනය තක්සේරු කිරීමට තැන මෙතැන නොවේ; එය ගැන මට එතරම් ඉහල ඇගැයීමක් ඇත්තේ නැත. එහෙත් මෙහි දී අදාල වන ප්‍රයුක්තිය නම් තැචර් උධෘතයන් පාවිච්චි කරන අන්දම යි. සර්විස් විසින් ලියන ලද (ලෙනින්ගේ) චරිතාපදානයේ 273-274 පිටුවලට හැරෙන කල (මෙහි අදාල අධෝලිපියේ දක්වා ඇති පරිදි) එහි ලෙනින් ට්‍රොට්ස්කිගෙන් අත් මිදීමට කල සැලැස්මක් ගැන කිසිදු සමර්පනයක් ඇත්තේ නැත. ඇත්තටම සර්විස් ලෙනින්ගේ සැලසුම් පිලිබඳ ඊට වඩා මුලුමනින්ම වෙනස් ඇගැයුමකි ඉදිරිපත් කර ඇත්තේ. සර්විස්ට අනුව ලෙනින් කලෙක ට්‍රොට්ස්කිව පාලනය කිරීම සඳහා ස්ටැලින් යොදාගත් අතර "විදේශ වෙලඳාම සහ වෙනත් කරුනු පිලිබඳව ස්ටැලින් සමග ඇති වූ මතභේදයේ දී ඔහු පසුබස්සා ලීය; වඩවඩාත් ප්‍රචන්ඩව හැසිරෙන්නට පටන් ගත් ස්ටැලින් පාලනය කිරීමට දැන් ට්‍රොට්ස්කි අවශ්‍යවිය." ලෙනින්ට ට්‍රොට්ස්කි සමග පෙර කල මතභේද පැවැති නමුත්, "ඔක්තෝබර් විප්ලවය ද සිවිල් යුද්ධය ද විසින් ඔවුන් දෙදෙනා එක් කොට තිබුනි. සමීප සහක්‍රියාකාරිත්වය ඇරඹීම සඳහා ලෙනින් ට්‍රොට්ස්කිව කැඳවා සිටියේ ය."[73] පිටු කිහිපයකට පසුව සර්විස් ට්‍රොට්ස්කි සහ ස්ටැලින් ගැන ලෙනින්ගේ මතය පිලිබඳව තව දුරටත් කතා කරයි. " මේ මිනිසුන් දෙදෙනාගෙන් ඔහු සීමාවන් සහිතව නමුත් ට්‍රොට්ස්කිට වඩා කැමතිවන තත්වයකට පත්ව සිටියේ ය. ස්ටැලින් තමාට එරෙහිව පිහිටි, දෛනික ප්‍රශ්නවල දී ලෙනින් ඔහු (ට්‍රොට්ස්කි) සමග සන්ධානයක් සොයා ලියූ ආසන්න ලිපිවලින් මෙය පැහැදිලි විය. (1922) දෙසැම්බර් අග දී ට්‍රොට්ස්කි 1902 සයිබීරියාවේ සිට ලන්ඩන් කරා පලා ආ තැන් පටන් ඔහු කෙරේ තමාගේ හැඟීම් වෙනස් නොවූ බව ද "මරනය තෙක්ම" ඒවා වෙනස් නොවනු ඇති බවද ට්‍රොට්ස්කිට විශ්වාසීව දැනුම් දෙන ලෙස කෲප්ස්කායාව ඇනවිය."[74] යලිත් වරක් අපට දැක ගත හැකි වන්නේ ට්‍රොට්ස්කිට අවමන් කිරීමේ තම ව්‍යායාමයේ දී තැචර්, වෙනත්

ඉතිහාසඥයෙකු නොකල ප්‍රකාශයක් ඔහුට පැවරූ තවත් අවස්ථාවකි.

අන් සියලුදෙනා මෙන්ම ඉතිහාසඥයෝ ද දෝෂයෙන් තොර වූවෝ නොවෙති. ඔවුහු ද වැරදි කරති. සෑම වැරදි උපුටා දැක්වීමක් ම වෘත්තීමය වසයෙන් කරුනු විකෘත කොට මුසාකරනය කොට දැක්වීම සඳහා දැනුවත් කුමන්ත්‍රනයක් තබා වෘත්තීයමය වසයෙන් අදක්ෂතාවය අඟවන්නක් සේ වුවද සැලකිය යුතු නැත. එහෙත් තැචර්ගේ ඉදිරිපත් කිරීම සැකසී තිබෙන්නේ පාඨකයන් අතර විශේෂයෙන්ම ශිෂ්‍යයන් අතර ට්‍රොට්ස්කි පිලිබඳ සාවද්‍ය මනෝරූපයක් නිර්මානය කිරීමට පමනක් නොව සකල ඉතිහාස යුගයක් ම පිලිබඳ අවමංගත වූ හා විකෘත වූ සංකල්පයක් නිර්මානය කිරීමට ය.

තැචර් හා ස්වේන් විසින් ලියන ලද චරිතාපදානයන් තුල ප්‍රකාශනයක් අත් පත් කරගෙන ඇත්තේ ඓතිහාසික සත්‍යය බාදනය වීමක් යයි යුක්ති යුක්තව ම විස්තර කල හැකි වූ ක්‍රියාවලියකි. ස්ටැලින්ගේ මුසා සහ අපරාධ එලිදරව් කිරීම තුලින්, එනම් සෝවියට් සංගමය (පමනක් නොව මුලු  නැගෙනහිර යුරෝපය සහ චීනය) තුලින් පොම්ප කොට ලෝකය පුරාම ස්ටැලින්වාදී පක්ෂ හා බැඳුනු ගනන් නැති ශාස්ත්‍රාලිකයන්ගේ සේවාව මගින්, පවත්වා ගෙන යනු ලැබූ ඉතිර පැතිර ගිය ට්‍රොට්ස්කි විරෝධී යක්ෂවේදය බන්ධනය කිරීම මගින් ඉස්මතු කර ගත්තා වූද ඔහු, මහා විප්ලවවාදී සටන්කරුවෙකු හා චින්තකයෙකුය යන ට්‍රොට්ස්කිගේ ඓතිහාසික ප්‍රතිරූපය දැන් යලිත් වරක් ප්‍රහාරයට ලක් කරනු ලැබ තිබේ. එක්තරා ජාතියක ඓතිහාසික-විරෝධී බුද්ධිමය ප්‍රතිවිප්ලවයක් ඉදිරියට පෙරලෙමින් පවතී; තැචර් හා ස්වේන් එයට තමන්ගේ ම අපකීර්තිමත් ප්‍රතිපදානයන් කරමින් සිටිති. ට්‍රොට්ස්කි පාච්චල් කර දැමීමට පමනක් නොව ඔහුව විහිලුවක් ලෙස පෙන්නීමට ද මොවුන් දක්වන්නා වූ අලජ්ජ භාවය අපට වටහා ගත හැක්කේ ඒ ආකාරයට ම පමනි.

## දෛනික ජීවිතයේ ගැටලු

උදාහරනයක් හැටියට *Problems of Everyday Life* 'දෛනික ජීවිතයේ ගැටලු' යන මාතෘකාව යටතේ පලකරන ලද ට්‍රොට්ස්කිගේ විෂ්මයාවහ ලිපි මාලාව කෙරේ තැචර් දක්වන ආකල්පය සලකා බලමු. තැචර් තතනන්නේ ට්‍රොට්ස්කි "රුසියානු සමාජයේ පොදු චාරිත්‍රධර්ම කෙරේ තැකීමක් නොකල ඉන් බොහෝ දුරස්ත වූ රුසියානු මහා ජනකාය අසංස්කෘතයන් යයි සැලකූ" අබලන් උද්ධච්චයකු ලෙස හැඳින්වීමට ය. ට්‍රොට්ස්කි "පලල් රුසියානු ජනතාව නූගත් අකාර්යක්ෂම, ජරා, කලට වේලාවට වැඩක් කරන්නට දන්නේ නැති, දිව්රීමට හා අසභ්‍ය වචන පාවිච්චියට පුරුදු වූ මිථ්‍යා දෘෂ්ටියට ගොදුරු වූවන් යයි විස්තර කලේ ය."[75] මේ ආකාරයට ඉදිරිපත් කරන ලද කල්හි, පාඨකයා පැහැදිලි ව ම යොමු කෙරෙන්නේ ට්‍රොට්ස්කි මහන්තත්වවාදී, අති මහත් රුසියානු ජනයාගෙන් ඈත් වූ විරසක වූ තැනැත්තෙකු ය යන නිගමනය. (ඔහු ට්‍රොට්ස්කිට පැවරීමට) අපේක්ෂා කරන මනෝ රූපය, ට්‍රොට්ස්කි පිලිබඳ ව පහත සඳහන් උපහාසාත්මක ප්‍රකාශයෙන් ද පෙනේ, "ට්‍රොට්ස්කිගේ පරමාදර්ශය සමන්විත වූයේ තමාගේ ම ඇබ්බැහිකම් පෘථුලව සටහන් කර ගැනීමක් ලෙස යයි නොසිතිය නොහැක. ඔහුගේ ඔවා තමාගේ ම සරලකාරී ලේබලයෙන් ගහනව ඇත." [76]

තැචර්ගේ සාරාංශය වනාහී ට්‍රොට්ස්කිගේ *Problems of Everyday Life* (දෛනික ජීවිතයේ ගැටලු) නමැති කෘතිය දුෂ්ට ලෙස සහ වංචනික ලෙස විකාර රූපයට නැගීමකි. ට්‍රොට්ස්කිගේ ආත්ම ප්‍රසාරක උද්ධච්ච භාවයේ ද, ඔහු තමාගේ ම විශේෂ ගතිගුනවලට කරගත් විලි නැති වර්නනාවේ ද උදාහරනයක් ලෙස (තැචර්) ඉදිරිපත් කරන කෘතිය රුසියානු විප්ලවවාදී ව්‍යාපාරයේ ඉතිහාසයේ සන්දර්භය තුල නිවැරදිව සහ දැනුම් සහිතව සලකා බලන කල්හි පැහැදිලි ව ම ඉස්මතු වන්නේ කම්කරු පන්ති විඥානයේ වර්ධනය ද සමාජවාදී විඥානය සඳහා අරගලය ද අතර සම්බන්ධතාවය පිලිබඳ මහාර්ඝ ගැඹුරු අර්ථකථනයක් බව වැටහෙයි. රුසියානු කම්කරුවන් කෙරේ ට්‍රොට්ස්කිගේ පෞද්ගලික විරෝධතාවල එපා කරපු කිලුටු පොදියක් ලෙස තැචර් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති මෙම ගති ලක්ෂන - නූගත්කම, අකාර්යක්ෂමබව සහ නිතර දිව්රීම වනාහී සාර් රුසියාවේ මහා ජනකාය විසින් විඳිනා ලද භයංකර පීඩනයේ ප්‍රකාශයෝ ය. ඒවා ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී බුද්ධිමතුන් අතර හොඳම කොටස් බොහෝ විට  "අපගේ භයංකර රුසියානු යථාර්ථය" යනුවෙන් විස්තර කල දෙයෙහි ම අංගයක් විය. මානව පරාභවයේ ලජ්ජාකාරී ප්‍රකාශනයන්ට එරෙහි මෙම බුද්ධිමතුන්ගේ අරගලය අන්තිමේ දී කම්කරු පන්තිය තුල ප්‍රගාඪ ප්‍රතිචාරයක් දිනාගත්තේ ය.[77]

ට්‍රොට්ස්කි 'දෛනික ජීවිතයේ ගැටලු' කෘතියේ මතු කල ප්‍රයුක්තීන් ගේ පෘථුල මානයන් හා අනේක සම්බන්ධතාවයන් ද "සංස්කෘතිමත් භාෂනය උදෙසා අරගලය" සහ "සභ්‍යතාවය සහ ආචාරශීලී බව දෛනික සම්බන්ධතාවන්ට අත්‍යාවශ්‍ය ලිහිසි තෙල් ය" යනාදී ඔහුගේ ලිපිවල අර්ථභාරය ද වටහා ගත හැක්කේ මෙම ලියවිලි පන්ති විඥානයේ ද ස්වසංස්කෘතියේ ද වර්ධනයට ප්‍රතිපදානයන් ලෙස කියවාගනු ලබන කල්හිය. මහාචාර්ය එස්.ඒ. ස්මිත් පෙන්නුම් කරන පරිදි 1920 ගනන්වල දී ස්ටැලින් බලය මත තමග්‍රහනය දැඩි කර ගැනීමෙන් පසුව "සභ්‍ය භාෂනය දේශපාලන න්‍යාය පත්‍රයෙන් වියැකී ගියේ ය."[78] ට්‍රොට්ස්කි මෙම ලිපිවල ලියා තබන බොහොමයක් දේ රුසියානු ශ්‍රාවකයකට අදාල වනවා පමනක් නොව ඓතිහාසික ආසක්තතාවක් දනවන්නේ

ද වේ. භයංකර යථාර්ථයකට මුහුන දී සිටුනා මෙකල්හි - සකල වර්ගයේ ම සමාජ පසුගාමීත්වය වගා කොට ධෛර්යමත් කරනු ලබන මෙකල්හි - ට්‍රොට්ස්කිගේ දෛනික ජීවිතයේ ගැටලු නම් කෘතිය කාලීන කෘතියක් ද වන්නේ ය.

තමා ලියන චරිතාපදානයේ සමහර තැන්වලදී තැචර් තනිකරම විසුලු සහගතයයි පමනක්ම විස්තර කල හැකි මට්ටම්වලට ඇද වැටෙයි. "ට්‍රොට්ස්කි තමාගේ සවජාතික ගැහැනුන් නොතකා හරින්නේ, වෙන ඕනෑ ම අහං-කේන්ද්‍රිත පුරුෂයෙකු මෙන්ම" ය.[79] මෙයට සාක්ෂ්‍ය ලෙස ඔහු ඉදිරිපත් කරන්නේ, ට්‍රොට්ස්කිගේ බිරිඳ ට්‍රොට්ස්කි සඳහා සඟරාවක් ඉල්ලා ගැනීමට ගියා"ය යන පුස්තකාල භාරකරුවෙකුගේ මතක සටහන් ය. ඉතින්, තැචර් මෙසේ කියයි, "අපට සොයාගන්නට ලැබෙන්නේ ට්‍රොට්ස්කි තමාගේ බිරිඳ (වැටුප් රහිත) ලේකම් කෙනෙකු ලෙස පාවිච්චි කල බවය...."[80] තමාගේ ම එක් ලිපියක සඳහන් කල පරිදි "යථාර්ථය ගැහැනියකගේ ඇසින් බරපතලව දැක ගැනීමට" අසමත්වීම ගැන තැචර් ට්‍රොට්ස්කිට අවමාන ද කරයි. තමාගේ දොස් පැවරීමට රුකුල් වසයෙන් තැචර් ඉදිරිපත් කරන්නේ "සත්තකින්ම ඔහු ලෙනින්ගේ තැන ගැනීමට ස්ත්‍රී අපේක්ෂකයකු සුදුසු ය"යි[81] "ට්‍රොට්ස්කි කියා නොසිටි බවකි; එසේ ම ඔහු ලෝකය තුල ස්ත්‍රියකගේ පර්යාලෝකය කුමක් විය යුතු ද යන්න පිලිබඳ තමා පොරොන්දු වූ වඩා සම්පූර්න විස්තරය ඉදිරිපත් කර සිටියේ ද නැත."[882] මෙවන් විවේචනවලට පිලිතුරු සැපයීමට මුල පුරන්නේ කොහොමද? [83]

.

**සටහන්**

[50] තැචර්, 7-8 පිටු.

[51] විප්ලවයේ හෘද සාක්ෂිය (*The conscience of the revolution*) 244 පිටුව. ඔක්තෝබරයේ පාඩම් කෘතිය විසින් අරඹන ලද විවාදය පිලිබඳ තවත් වෛෂයික ඉදිරිපත් කිරීමක අගනා උල්පතක් වූයේ ඊ.එච්. කාර්ගේ සෝෂලිසම් ඉන් වන් කන්ට්‍රි. දෙවන වෙලුම ( බැල්ටිමෝර්, පෙන්ගුවින්, 1970 ) 11-44 පිටු.

[52]. තැචර් 35 පිටුව

[53]. සැබෑ පාඨක සංඛ්‍යාවකට වඩා මුද්‍රනය වැඩිවන්නට ඉඩ තිබුනේ නැති දැයි විමසන තැචර්, පුවත්පතේ සංසරන සංඛ්‍යාවන්ගේ වැදගත්කම අඩු කර දැමීමට උත්සාහ කරයි. එවැන්නක් සිදුවිය නොහැකිවා නොවේ. හැබැයි අතින් අත මාරු කොට කියවන ලද පිටපත් සංඛ්‍යාව සලකා බැලුවොත්'හෙම පාඨක සංඛ්‍යාව මුද්‍රිත සංඛ්‍යාව ඉක්මවා ගියේ යැයි සිතන්නට ද ඉඩ නැත්තේ නොවේ.

[54]. තැචර්, 35 වන පිටුව.

[55]. තැචර්, 35 වන පිටුව.

[56]. තැචර්, 35 වන පිටුව.

[57].ලන්ඩන්, 1967, පිටු 60-61.

[58]. එම පිටු 60.

[59]. බොල්ෂෙවික්වාදයේ ආරම්භයෝ (නිව් යෝක්, 1970), 345 පිටුව.

[60]. තැචර්, 125 පිටුව (අවධාරනය ඇදිනි) ඇත්ත නම්, ට්‍රොට්ස්කි කවර කලෙකවත් තම පෞද්ගලික සර්ව නිර්දෝෂතාවය පිලිබඳ ආත්මීය කියා පෑම් කලේ නැත. තමාගේ "ක්‍රම විය" පමනක්ම වැඩ කරනු ඇතැයි ට්‍රොට්ස්කි තර්ක කලේ ය යන්නට කිසිදු උදාහරනයක් තැචර් ඉදිරිපත් කර ඇත්තේ ද නැත.

[61]. තැචර්, පිටු 125-26.

[62]. ඔක්තෝබර් 19, 1923 ලිපිය වැලන්ටිනා විල්කෝවා විසින් සංස්කරනය කොට පරිවර්තනය කරනු ලැබ 1923 රුසියාවේ බලය සඳහා අරගලය නැමැති කෘතියේ සංගෘහිත ලියවිලිවලට ඇතුලත් කර ඇත. තැචර් නිතර ම විල්කෝවාගෙන් උපුටා දක්වන නමුත් ඔක්තෝබර් 19 ලිපියේ මූලාශ්‍රයක් ලෙස ද එහි ඒ පිලිබඳ ඇගේ තක්සේරුව ද සඳහන් කරන්නේ නැත. ඔක්තෝබර් 19 ලිපිය, "සාකච්ඡාවේ දී; බහුතරය විසින් යොදාගනු ලැබූ ක්‍රමවිධි විචිත්‍ර ලෙස විදහා දක්වන්නක් යයි විල්කෝවා ලියයි. ඔක්තෝබර් මධ්‍යමකාරක සභා සැසියේ දී ප්‍රධාන ලේකම්වරයා යොදාගත් තර්ක ක්‍රමය ද ඉදිරිපත් කිරීමේ ශෛලිය ද සමග ලියුමේ ශෛලිය ද ගැලපුනු හෙයින් එම ලියුම ස්ටැලින්ගේ ම ලියුමක් වීමට හොඳටම ඉඩ තිබේ. ලියුමේ තදින් ඇඹරීගිය අර්ථකථන, පල්බොරු පමනක් නොව ඓතිහාසික කාරනා, පක්ෂය තුල පැවැති තත්වය සහ රටේ සමස්ත තත්වය පිලිබඳ තක්සේරුවේ බරපතල මුසාකරනයන් ද අන්තර්ගත විය." (නිව් යෝක්: ප්‍රොමිතියස් මුද්‍රනාලය 1996, 28 පිටුව)

[63]. (ලන්ඩන්, 1969), පි.307.

[64]. තැචර්, පි.127.

[65]. පි.221

[66]. සමස්ත වෙලුමටම කරන තම පොදු හැඳින්වීමේ දී ග්‍රෙගර් සීතල යුද්ධයේ ප්‍රති-කොමියුනිස්ට්වාදී දෘෂ්ටිවාදීන්ගේ වචනවලින් ලෙනින් කටුක ලෙස හෙලා දකී. ලෙනින්ගේ පෞද්ගලික නො ඉවසිලිවන්ත බව සහ දේශපාලන ධර්මයෙන් තර්කානුකූලව ම ස්ටැලින්වාදය පැන නැංගේ යයි ඔහු තර්ක කරයි.

> "ලෙනින් ගුරුවරයා වූ අතර ගෝලයා වූ ස්ටැලින් ලෙනින්ගේ උරුමය එහි තර්කානුකූල නිගමනය දක්වා ඉදිරියට ගෙන ගියේ ය. උසස් මූලධර්මවල නාමයෙන් කරන ලද කෲර ක්‍රියා පිලිබඳ විස්තරවලින් ඉතිහාසයේ පිටු පිරී ඇත්තේ ය. බොල්ෂෙවික් නායකයන් දෙදෙනා ද මීට ව්‍යතිරේක වූයේ නැත. පිලිගැනීමට කොතරම් අපහසු වුවත් මේ දෙදෙනාම ඔවුන්ගේ ම ආකාරයට ඉතාමත් ශ්‍රේෂ්ඨ පරමාර්ථය යයි ඔවුන් සැලකූ දෙයට සේවය කිරීමට උනන්දු වූහ; ඉතිහාසයේ උත්ප්‍රාසයන්ගෙන් එකක් මෙහි පවතී; මන්ද යත්, "මානව වර්ගයා ගලවා ගැනීමට දන්නා අය තරම් භයානක වූ ද නිර්දය වූ ද වෙනත් මිනිසුන් ඇත්තේ නැති නිසා ය." 38පි.)

[67]. තැචර්, පි.128

[68] අදාල ඡේදයක ට්‍රොට්ස්කි මෙසේ කීය:

"ඉංග්‍රීසීන්ට ආප්ත වාක්‍යයක් තිබේ. 'හරි උනත් වැරදි උනත් මගේ රට, ඊට වඩා ඉමහත් ඓතිහාසික යුක්තිසහගත භාවයකින් යුතුව අපට මෙසේ කිව හැකි ය. කිසියම් දෙන ලද මොහොතක නිවැරදි වුවත්, වැරදි වුවත්, මෙය මගේ පක්ෂයයි. මා ඒ හෝ මේ කරුන මතු කිරීමෙන් වැරැද්දක් කරන ලදැයි සමහර සහෝදරවරුන් සිතුවත්, ඒ හෝ මේ අන්තරාය මවිසින් සාවද්‍ය ලෙස විස්තර කරන ලදැයි සමහර සහෝදරවරුන් සිතුවත් මා විශ්වාස කරන්නේ තමා අන්තරායක් යයි සලකන දෙය පිලිබඳව පක්ෂයට අනතුරු හඟවන්නා වූ පක්ෂ සාමාජිකයෙකු වසයෙන් මා මගේ යුතුකම ඉටු කරමින් සිටින බවය." ට්‍රොට්ස්කිගේ දේශනයේ සම්පූර්න පාඨය සඳහා බලන්න *The challenge of the Left opposition* (ද චැලෙන්ජ් ඔෆ් ද ලෙෆ්ට් ඔපොසිෂන් 1923-25 (නිව් යෝර්ක් 1976) පිටු 161-180. ඉහත දක්වන ලද උධෘතය 179 පිටුවේ ඇත.

[69]. ලෙනින් සංගෘහිත කෘති. 36 වෙලුම, (මොස්කව්, 1966) පි.595.

[70]. එම, පිටු 594-595.

[71]. එම, පිට 596.

[72]. තැචර්, 131 පිටුව (අවධාරනය ඇදිනි)

[73]. *Lenin: A political life,* ලෙනින්: දේශපාලන ජීවිතයක් වෙලුම 3.(බ්ලූමින්ග්ටන් ඇන්ඩ් ඉන්ඩියානා පොලිස්, 1995 පිටු 273-74.

[74]. එම. 285 පිට.

[75]. තැචර්, 135 පිට.

[76]. තැචර්, 135-37 පිටු.

[77]. එසෙක්ස් සරසවියේ මහාචාර්ය එස්.ඒ. ස්මිත් විසින් මැනවින් පැහැදිලි කරන ලද පරිදි:

> "1880 ගනන්වල පටන් පැන නැංගාවූ 'දැනුවත්' කම්කරුවන් ස්තරයක් තමන් ගැලීසිටියා වූ දිලිඳුකමට ද පරාභවයට ද එරෙහිව තම තත්වය වර්ධනය කර ගැනීම උදෙසා අරගලයක නිරත විය. රැඩිකල් බුද්ධිමතුන් අනුව හැඩ ගැසුනු ඔවුහු බුද්ධිමතුන් විසින් නියෝජනය කරන ලද කුල්ටූර්නෙස්ට්හි (සංස්කෘතිකමත් බවේ) පරමා'භිලාෂය සමග අනන්‍යවීගත්තාහ. කුල්ටූර්නෙස්ට් යන මෙම සංකල්පය පුද්ගලයාගේ වර්ධනය පිලිබඳ මතාන්තර සමග පලල් වසයෙන් සමාජයේ විකාශනය පිලිබඳ කල්පනා සම්බන්ධ කලේ ය. එය එක් අතකින් බුද්ධිමය වර්ධනය හැසිරීමේ ශිෂ්ටබව සහ සදාචාරාත්මක වර්ධනය: කොටින්ම කිවහොත් මිනිසාගේ අභ්‍යන්තර උදාරතාවට ඔබින්නා වූ ද සෙස්සන්ගෙන් ගෞරවය දිනා ගැනීමට සමත් වූ ස්වකීයතාවයක් නිර්මානය කර ගැනීමට හැකියාව යන අර්ථයෙන් අභ්‍යන්තර වගාව සලකුනු කලේ ය; අනෙක් අතට කුල්ටූර්නෙස්ට් කිසියම් සමාජයක් විකාශනික වර්නමාලාවේ කුමන මට්ටමකට ලඟාවී තිබේ ද යන්න ඇගැයීම සඳහා යොදාගනු ලැබූ සමාජවිද්‍යාත්මක ප්‍රවර්ගයක් ද විය. මේ අර්ථයෙන් ගත් කල්හි, රුසියාව උප ලක්ෂිත වූයේ හරියටම සංස්කෘතිමත්බවින් තොර වීමකිනි. රුසියාව දක්නා ලද්දේ බටහිර යුරෝපීය සංස්කෘතියට වඩා ආසියාතික ම්ලේච්ඡත්වයට සමීප වූ රටක් ලෙස ය.

ස්මිත් තවදුරටත් මෙසේ ලියයි:

> "දැනුවත් කම්කරුවන්ට, කුල්ටූර්නෙස්ට් (සංස්කෘතිකමත් බව) අත් කර ගැනීමේ කේන්ද්‍රිය අංගයක් වූයේ දිව්රීම හැර දැමීම ය. බුද්ධිමතුන් මෙන්ම, මෙම කම්කරුවෝ ද දිව්රීමේ පුරුද්දට හැරී තිබීම එම වහල් බවට පත් කෙරුනු රුසියානු සමාජයේ අසංස්කෘතිමත් බවේ ලක්ෂනයක් විය. පුද්ගලික මට්ටමේ දී දිව්රීම පෙන්නුම් කලේ ලිච්නොස්ට් හෙවත් මනුෂ්‍යයෙක් වසයෙන් පෞද්ගලික උදාරත්වය සහ අගය පිලිබඳ එම අභ්‍යන්තර හැඟීම ද සෙස්සන් කෙරේ ගරුත්වයක් නොතිබීම ද පිලිබඳ ලකුනක් විය. කතාබහ (සහ හැඟීම් පාලනය කර ගැනීමට උගෙනගැනීම සංස්කෘතිමත් බවේ හදවතෙහි පැවති බුද්ධිමය සහ සදාචාරාත්මක ස්වයං-ක්‍රියාකාරිත්වය අත්පත් කර ගැනීමට ප්‍රානසමව වැදගත් වූ සාධකයක් ලෙස තකන ලදී. කතාබහ පාලනය කර ගැනීමේ හැකියාව එහි සීමාවන් පුලුල් කිරීම මගින් පෙන්නුම් කලේ වැඩ කරන ජීවිතයේ අංශ ද අවසාන වසයෙන් සමස්ත සමාජය ද ඇතුලත්වෙන සේ පෘථුල ලෙස එසේ කිරීමේ හැකියාව ය. සමාජමය මට්ටමේ දී කම්කරුවන් අතර දිව්රීම පැතිරයාම වනාහී දැනුවත් සුලුතරයට තම පන්තියේ පසුගාමිත්වය මතක් කරන්නක් විය. [පසු කාලීන අධිරාජ්‍ය හා මුල් සෝවියට් සමාජයේ දිව්රීම හා නරකම මතවල සමාජමය අර්ථය - "The Social Meanings of Swearing: Workers and Bad Language in Late Imperial and Early Soviet Russia,, *Past and Present* , No. 160. : අගෝස්තු 1998*, පිටු 177-79.]

[78]. මහාචාර්ය ස්මිත්

"ස්ටැලින් යුගය තුල නව නිලධාරි ආර අතර දිව්රුම් පද පාවිච්චි කිරීම පිලිගත හැකි විය. (එම 200 පිටුව)

[79].තැචර් - 137 පි.

[80]. එම.

[81]. එම 138 පි.

82 ස්ත්‍රී අපේක්ෂිකාව කවුරු විය යුතු දැයි කියන්නට තැචර් අසමත් වෙයි. මෙම කරුනට පවා මුලුමනින්ම පිලිතුරු නොලැබී යාමට ඉඩ නොතබනු වස් ලිංගික වසයෙන් විමුක්තිය ලත් ගැහැනියකගේ ස්වයංචරිතාපදානය නම් ඇලෙක්සැන්ඩ්‍රා කොලොන්තායිගේ ලිපියකින් මම උපුටා දක්වමි. බොල්ෂෙවික් පක්ෂයේ ප්‍රධාන සාමාජිකාවක් වූ ඕ විප්ලවයෙන් පසු ගැහැනුන් අතර වැඩ සම්බන්ධීකරන කාර්යාලයේ නායකත්වය ගත්තා ය; මෙම පැවරුම පිලිබඳව මෙස් කියා සිටියා ය: "ගබ්සා කිරීම පහසු කල නීතිය සම්මත කරන ලද අතර ගැහැනුන්ට යහපත් වූ රීති මාලාවක් අපගේ කාර්යාලය විසින් ඉදිරිපත් කොට නීති ගතකරන ලදී. ... අපගේ වැඩවලට ලෙනින්ගේ නොමඳ සහාය ලැබිනි. යුද්ධමය කටයුතුවල පමන ඉක්මවා බරපතල ලෙස යෙදී සිටි ට්‍රොට්ස්කි අපගේ සම්මේලනවලට නොවරදවාම ද සන්තෝෂයෙන් ද සම්බන්ධ වූයේ ය." (නිව් යෝර්ක් 1971) 42 පිටුව. මෙම සඳහන ලියන ලද්දේ 1926 දී ය. ඒ වන විට ට්‍රොට්ස්කිට ප්‍රසංශා කිරීම එතරම් "ඇඟට හොඳ" දෙයක් වූයේ නැත. ඒ නිසා ම කොලොන්තායිගේ වචන විශ්වසනීයත්වයක් ලබයි.

[83]. තැචර්, 151 පි.

© www.wsws.org